ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2568 2025 මැදින් 13 මැදින් කළාපය

දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමික ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"සිත රැකගැනීම නිවනට මඟයි"

"නගරං යථා පච්චන්තං - ගුත්තං සන්තරබාහිරං"
ඒවං ගෝපේථ අත්තානං - ඛණෝ වේ උපච්චගා
ඛණාතීතාහි සෝචන්ති - නිරයම්හි සමප්පිතා"

(ධම්ම පදය - නිරය වග්ග)

සුපින්වතුනි,

"රටේ කෙළවර පිටිසරබද පෙදෙසක පිහිටි ඇතුළතින් හා පිටතින් (සතුරන්ට පැමිණිය නොහැකිසේ) මැනවින් ආරාක්ෂා කරන ලද නගරයක් මෙන් තමාගේ සිත රැකගන්න. ක්ෂණය (මේ ලැබුණ අවස්ථාව) ඉක්මයාමට නොදෙන්න. ක්ෂණ සම්පත්තිය මහහැරුණු අය නිරයෙහි ඉපදී ශෝක කරත්" බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසද්දී භික්ෂු පිරිසක් සසර දුක් කෙළවර කර ගැනීමේ අදහසින් බුදුරජාණන්වහන්සේ වෙත පැමිණ, කමටහන් ලබාගෙන භාවනා කිරීම සඳහා ඈත පිටිසරබද ප්‍රදේශයක වස් වසන්න ගියා. වස් එළඹී පළමුවන මාසයේ නගර වැසියන් භික්ෂු පිරිස ගෞරවයෙන් පිළිගෙන අසල ඇති වනයේ වැඩවිසීමට තැන් පිළියෙළ කර දී සිව්පසයෙන් සත්කාර කළා.

භික්ෂුන් කරදරයක් නැතිව භාවනා කළා.එහෙත් දෙවෙනි මාසයේ මේ භික්ෂූන්ට ලොකු කරදරයකට මුහුණ පාන්න සිදුවුණා.

වෙනත් ප්‍රදේශයකින පැමිණි දාමරිකයන් පිරිසක් මේ නගරයට කඩා වැදිලා නගරවැසියන්ගේ හරුබස්ස ඔක්කොම පැහැර ගත්තා. ඊටත් වඩා නගර වැසියන්ට බලපෑවේ මේ මැර කල්ලිය ඒ නගරේ හිටපු කඩවසම් තරුණ තරුණියන් පිරිසකුත් පැහැර ගෙන යාමයි. අහාර පාන වස්තුවනම් හම්බ කරගන්න පුළුවන්.

මේ කරදරය නිසා නගරවාසීගේ ජීවිත උඩු යටිකුරු වුණා. දරුවන් නැති ශෝකයෙන් බොහෝ අය අඬමින් කල් ගත කළා. තවත් අය නගරයේ ආරක්ෂාව දුර්වලවෙලා තිබුණ තැන් සොයා බලා නැවත ආරක්ෂාව තහවුරු කළා. නගර ප්‍රාකාරය අලුත්වැඩියා කළා. එකම පිවිසුම් මාර්ගයත් ඉතිරි කරගෙන අනෙක් සියලු ප්‍රවේශ මාර්ග වසා දැමුවා. දොරටුව මුරකරන්න බුද්ධිමත් දොරටුපාලයෙකු පත් කළා. නගරය වටා මුරකාවල් යෙදුවා. මේ වැඩ නිසා වස්වැසූ භික්ෂූන් ගැන නගරවාසීන්ට අමතක වුණා. ආහාරපාන පිළිබඳ ගැටළුත් තිබුණා. දානය, ගිලන්පස නිසිවේලාවට ලැබුණේ නැහැ. වනමුල් පලාපලවලින් යැපෙන්න භික්ෂූන්ට සිදුවුණා. රහත් වෙන්න හිතාගෙන ආවත් ඒ සියල්ල අසාර්ථක වුණා. වස්වසල ඉන්න නිසා මෙතැනින් පිටත් වෙලා පහසු තැනකට යන්නත් බැහැ. බොහෝම අමාරුවෙන් ජීවිතය ගැටගසා ගත් උන්වහන්සේලා වස් කාලය අවසානයේ මහා පවාරණය සිදුකරළා, නගරවාසීන්ටත් අනුශාසනා කරලා ආපසු බුදුහාමුදුරුවන් වෙත පැමිණියහ.

සුපුරුදු පරිදි බුදුහාමුදුරුවෝ ඒ භික්ෂූන්ගෙන් ඇහුවා වස්කාලය හොඳින් ගතකළාද? කමටහන් වැඩුවද? කියල. භික්ෂූන් වහන්සේලා තමන් මුහුණ පෑ සිද්ධිය බුදුහාමුදුරුවන්ට පැවසුවා. බලාපොරොත්තු ඉටුකරගත නොහැකි වූ බවත් පැවසුවා.

හැමදාම, හැම තැනම සුවපහසුවෙන් ඉන්න ලැබෙන්නේ නැහැ. දුෂ්කර කාලයන්, දුෂ්කර තැන් අපට හමුවෙනවා. ඔබ සියලු දෙනා වස් වසූ පිටිසර නගරයේ මිනිසුන්ට සතුරු ප්‍රහාරය ලැබුණු හැටියේම, ඉදිරියේදී සතුරු කරදර ඇති නොවන විදියට නගරය ආරක්ෂා කර ගන්න, දිවා රෑ නොබලා වැඩ කළා. නුඹලාත් නුඹලාගේ සිත කෙලෙස් නමැති සතුරන්ට ඇතුළු නොවිය හැකි පරිදි ආරක්ෂා කර ගැනීමට නුඹලාගේ ඇස, කන ආදී ඉන්ද්‍රියන්ගේ සංවරය නමැති පවුරු පදනම් ශක්තිමත්ව ගොඩනඟා ගත යුතුයි. කියල බුදුහාමුදුරුවෝ වදාළ. දේශනාව අවසානයේ භික්ෂු පිරිස රහත් ඵලයට පත්වුණා.

අප හැමදෙනාම බාහිර ලෝකයත් සමග සම්බන්ධ වෙන්නේ ඇස කන ආදී සළායතන හරහා නේ. බාහිර ලෝකය සැපයි, සුබයි කියල දකින කොට අප තුල රාග, දෝස, මෝහ ඇතිවී කර්ම සිදුවී ඊළඟ භවය සකස් වෙනවා. මේ දොරටු හය රැකගත්තොත් අපට සසරින් මිදෙන්න පුළුවන්. මෙම කාරණය වඩා හොඳින් ඔබට පැහැදිලි කරදීම සඳහා බුදුරජාණන්වහන්සේ වදාළ නගරූපම සූත්‍රය (අංගුත්තර නිකාය, සත්තක නිපාතය) ඉතා සුදුසු නිසා එය ඔබට ගෙන හැර දක්වන්නම්.

"මහණෙනි, රජකුගේ ඇත පිටිසර පිහිටි නගරයක් ආරක්ෂක පියවර හතකින් හොඳට ආරක්ෂා කරල තියෙනවනම් ආහාරණය කළයුතු හෙවත් නගරයට පිටතින් සපයා ගත යුතු කරුණු හතරක් නගරවාසීන්ට කරදරයකින් තොරව ලබාගන්න කටයුතු කරල තියෙනවනම් කිසිම සතුරකුට ඒ නගරය යටත් කරගන්න බැහැ. මොනවද ඒ ආරක්ෂක පියවරවල් හත?"

I. නගරයේ ඉන්ද්‍රඛීලය නොසෙල්වන පරිදි සිටුවා තිබීම
II. නගරය වටේ ගැඹුරු වූත්, පළල් වූත් දිය අගලක් තිබීම.
III. නගරය වට කර ඇති පවුරු වටා, මුර භටයන්ට ඇවිදගෙන යා හැකි ඉතා උස් වූද, ඉතා පළල් වූද පාරක් තිබීම.
IV. අවශ්‍ය තරම් අවි - ආයුධ එක් රැස් කරගෙන තිබීම.
V. බොහෝ බලසේනාවන් නගරයෙහි රඳවා තිබීම.
VI. හඳුනන අයට පමණක් නුවර ඇතුළට ඒමට අවසර දෙන, නොහඳුනන අය වළක්වන, කථාකිරීමෙහි දක්ෂ, ඥානවන්ත දොරටුපාලයකු සිටීම.
VII. ඉතා උස් වූ , ඉතා පළල් වූ, සුණු පිරියම් කළ, මහා ප්‍රකාරයකින් නගරය වට කොට තිබීම.

ඒ වගේම නගරයට පිටතින් ගෙන ආයුතු,
නගරවාසීන්ට අත්‍යවශ්‍ය දේවල් හතරක් ගෙනවුත් ගබඩා කරගෙන කරදරයකින් තොරව නගර වැසියන්ට ඒවා ලබා ගැනීමට පහසුකම් සලසා තියෙන්නත් ඕන. මොනවද ඒ හතර.?
I. දර, ජලය ගෙවල් සෙවිලි කරන ද්‍රව්‍ය අවශ්‍ය තරමට රැස්කරගෙන තිබීම.
II. ප්‍රධාන ආහාර වේල සඳහා අවශ්‍ය වන සහල්, යව ආදී ධාන්‍ය වර්ග රැස් කරගෙන තිබීම.
III. තල, මුං, මෑ ආදී අතිරේකව අවශ්‍ය වන ආහාර වර්ග රැස්කරගෙන තිබීම.
IV. තෙල්, ගිතෙල්, මීපැණි, සකුරු, සරක්කු ආදී ඖෂධ වර්ග අවශ්‍ය තරමට රැස්කරගෙන තිබීම.

"මහණෙනි, මෙන්න මේ වගේ මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයා සප්ත ධර්මයකින් හා ධ්‍යාන සතරකින් යුක්ත විය යුතුයි. ඒ ධර්ම හත මොනවාද?"
I. තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිගන්නා, නවඅරහාදී බුදුගුණ පිළිගන්නා ශ්‍රද්ධාවන්තයකු වීම. නගරයේ ඉන්ද්‍රඛීලය මෙන් නොසෙල්වෙන පරිදි පිහිටි මේ ශ්‍රද්ධාව නිසා ආර්ය ශ්‍රාවකයා අකුසලය අත්හරිනවා. කුසලය වඩනවා. පිරිසිදු ජීවිතයක් ගත කරනවා.
II. නගරය වටා ඇති දිය අගල වගේ ආර්ය ශ්‍රාවකයා තමන්ගේ තිදොර වටා ලැජ්ජාව නමැති දිය අගල තනා ගන්නවා. එවිට හෙතෙම තිදොරින් දුසිරිත් කිරීමට ලජ්ජා වෙනවා. අකුසලය අත්හැර කුසලය වඩනවා. පිරිසිදු ජීවිතයක් ගත කරනවා.
III. නගරයේ පවුරු වටා තියෙන ඇවිද යා හැකි මාර්ගය වගේ කෙලෙස් නමැති සතුරන් දුර එන විටම දැක භය ඇති කරගෙන ඔවුන්ගේ ආරක්ෂාව වීමට කටයුතු කරනවා. පවට භය වීම නම් වූ මාවතෙන් යුක්ත ආර්ය ශ්‍රාවකයා අකුසල් අත්හැර

කුසල් වඩනවා. පිරිසිදු ජීවිතයක් ගත කරනවා.
IV. සතුරාට මුහුණ දීමට අවශ්‍ය තරම් ආයුධ නගරය තුළ රැස්කර තබාගන්නවා වගේ ආර්ය ශ්‍රාවකයා ධර්මය වැඩිපුර අහනවා, දහම් පොත් කියවනවා. අසා කියවා දැනගත් දහම් කරුණු මනසයේ තබාගෙන වාචිකව පුරුදු කරනවා. මනසින් වීමසා බලනවා. එවිට ගැටළු කැන් ලිහී ධර්මය නුවණින් අවබෝධ කරගන්න හැකිවෙනවා. ධර්මය පිළිබඳව ඇසු පිරූ කැන් ඇති බව නමැති ආයුධ වලින් යුක්ත ආර්ය ශ්‍රාවකයා අකුසල් නමැති සතුරන් දුරු කරනවා. කුසල් නමැති මිතුරන් ලං කරගන්නවා.අකුසලයෙන් කිලිටි නොවූ ජීවිතයක් ගතකරනවා.

ආර්ය ශ්‍රාවකයා රැස්කර තබාගත යුතු ධ්‍යාන මොනවා ද?
I. නගරවැසියන් අවශ්‍ය දර, වතුර, සෙවිලි ද්‍රව්‍ය රැස් කර තබා ගන්නවා වගේ අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථම ධ්‍යානය උපදවා ගන්නවා.
II. නගරවැසියන් ප්‍රධාන ආහාර රැස්කර තබාගන්නවා වගේ ආර්ය ශ්‍රාවකයා විතක්ක විචාර නැති, සිත එකඟ කරන, ප්‍රීති සැපය ඇති දෙවෙනි ධ්‍යානය උපදවා ගන්නවා
III. නගරවාසීන් අතිරේක ආහාර රැස්කර තබා ගන්නවා වගේ ආර්ය ශ්‍රාවකයා ප්‍රීතියෙහි නොඇලී උපේක්ෂාව ඇති තෙවෙනි ධ්‍යානය උපදවා ගන්නවා.
IV. නගරවාසීන් බෙහෙත් ඖෂධ රැස් කර තබාගන්නවා වගේ ආර්ය ශ්‍රාවකයා සතරවෙනි ධ්‍යානය උපදවා ගන්නවා.

මේ ධ්‍යාන හතර ඔහුට කෙලෙස් සතුරන්ගෙන් නැති නොගැනීම පිණිස, නිවනට බැසගැනීම පිණිස උපකාර වෙනවා.

පින්වත් ඔබ සියලු දෙනාත් ඉන්ද්‍රිය මඟින් අරමුණු ගන්න අවස්ථාවේ සතිය නමැති දොරටුපාලය යොදවා අකුසල් සිතිවිලි නමැති සතුරන් බැහැර කොට කුසල් නමැති මිතුරන් පමණක් ළං කර ගැනීමට උත්සාහ කළොත් නිවන් දකින්න හැකිවෙනවා.

සැමට තෙරුවන් සරණයි!